**ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය**

-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙ 2010 **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර** 2010 **දෙසැම්බර් 31 දිනට** ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ **ක්‍රියාකාරීත්වය පිළිබඳ තතත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.**

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී .ල .ගි . ප්‍ර)**

-------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී.ල.ගි.ප්‍ර. 18 ට අනුව වත්කම් පාවිච්චියට ගත් දිනයේ සිට ක්ෂය කළ යුතු වුවත්, අධිකාරිය විසින් වත්කම් මිලදී ගත් වර්ෂය සඳහාම ක්ෂය ප්‍රතිපාදනය සිදු කර තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ශ්‍රී.ල.ගි.ප්‍ර. 9 ට අනුව ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රමාණය කොපමණද යන්න මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුලින් පැහැදිලි ලෙස හෙළිදරව්කර නොතිබුණි.

1.2.2 **ගිණුම්වලින් අත්හැරීම්**

-----------------------

ගිණුම් අංක 103-1003-9-3320761 දරන ජංගම ගිණුමේ 2010 දෙසැම්බර් 30 දිනට මුදල් පොත අනුව පැවති රු.385,769 ක් වූ ශේෂය, මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැර තිබුණි.

### 1.2.3 අනුචිත හෙළිදරව් කිරීම

බාහිර පාර්ශව විසින් කරන ලද තැන්පතුවල පැවති රු.868,089 ක ඍණ ශේෂ ජංගම වගකීම්වලින් අඩු කිරීම හේතුවෙන් එම ශේෂය ගිණුම්වලින් ඉවත් වී ජංගම වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වීමක් නිරීක්ෂණය විය.

### 1.2.4 නොසැසඳුනු ගිණුම් ශේෂ

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පහත සඳහන් ගිණුම් හා ඊට අදාල උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.749,146 ක වෙනසක් නිරීක්ෂණය විය.විස්තර පහත පරිදි වේ.

| අයිතමය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපලේඛන අනුව ශේෂය | වෙනස |
|---|---:|---:|---:|
| | රු. | රු. | රු. |
| දේශීය මිලට | | | |
| ගැනුම් අත්තිකාරම් | 5,864,525 | 5,865,400 | 876 |
| ආපදා ණය | 13,523,338 | 13,348,283 | 175,054 |
| ඉන්ධන අත්තිකාරම් | 987,627 | 431,036 | 556,591 |
| බයිසිකල් ණය | 113,625 | 130,250 | 16,625 |
| | 20,489,115 | 19,774,969 | 749,146 |

### 1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ධීවර කණ්ඩායම් 25 ක් සමඟ ඇති කර ගත් ගිවිසුම අනුව මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක ස්ථාපනය කිරීම සඳහා අධිකාරිය විසින් දරන ලද පිරිවැය, වාරික ලෙස බීජ නිෂ්පාදන සංවිධානවලින් අයවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට එසේ අයවියයුතු වටිනාකම රු.3,170,196 වු අතර , එම මුදල අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) ඇසිත්තන් සඳහා මත්ස්‍ය බීජ නිෂ්පාදන සංවිධාන වෙත ණය පදනම මත ලබා දී ඇති මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු. 2,316,597 ක ණය මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබු අතර කාලය වර්ෂ 1 1/2 ද ඉක්මවා තිබුණි.

(ඇ) අධිකාරිය හා පෞද්ගලික ආයතනයක් අතර ඇති කර ගෙන ඇති හවුල් ගිවිසුම අනුව 2010 ජනවාරි සිට මාසිකව බදු කුලී ලෙස රු.309,166 ක් අධිකාරිය වෙත ලැබිය යුතු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරියට ලැබිය යුතු මුදල රු.2,091,660 ක් විය.

(ඈ) පොළොන්නරුව මිරිදිය ධීවර මධ්‍යස්ථානය පෞද්ගලික ආයතනයක් වෙත බදු දීම හේතුවෙන් 2007 ඔක්තෝබර් සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබිය යුතු මුදල් රු.669,375 ක් විය.

(ඉ) අධිකාරියේ ව්‍යාප්ති නිලධාරීන්ට ණය පදනම මත ලබාදී තිබූ විසිතුරු මසුන් වෙනුවෙන් ලැබිය යුතු රු.80,830 ක මුදල අයකරගෙන නොතිබුණි.

(ඊ) කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක ස්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ අධිකාරිය විසින් රු.11,094,329 ක පිරිවැයක් දරා ඉදි කරන ලද බීජ අභිජනන ඒකක 25 භාර දුන් සංවිධාන 25 න් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.3,170,196 ක වාරික මුදල් අයකරගෙන නොතිබුණි.

### 1.2.6 විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොකිරීම

---------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වන රු.707,899,250 ක ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා වන පහත සඳහන් සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විස්තරය | | වටිනාකම | විගණනය සඳහා ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| i. | ගෙවිය යුතු වැටුප් හා වේතන | 566,093 | ❖ උපලේඛන<br>❖ කාල විශ්ලේෂණ |
| ii. | අවලංගු කරන ලද චෙක්පත් | 552,652 | ❖ උපලේඛන හා ලිපිගොනුව |
| iii. | ස්ථාවර වත්කම් | 706,780,505 | ❖ ස්ථාවර වත්කම් ලේඛන<br>❖ භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| | | 707,899,250 | |

### 1.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - (මු.රෙ) මු.රෙ. 177 | නියැදි පරීක්ෂාවට අනුව රම්බඩගල්ල මධ්‍යස්ථානය විසින් එකතු කර ගන්නා ලද රු.42,204 ක් අවස්ථා 07 කදී දින 06 සිට දින 13 දක්වා ප්‍රමාද වී බැංකුගත කර තිබුණි. |

| | | |
|---|---|---|
| | මු.රෙ. 394(අ), (ආ) | අවලංගු කරන ලද චෙක්පත් පරීක්ෂා කොට ගොනුගත කර, අවලංගු කිරීම් පිළිබඳ විස්තර චෙක් උප පත්‍රිකාවේ සටහන් කළ යුතු වුවත් වටිනාකම රු.2,648,323 ක් වූ අවලංගු චෙක්පත් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | මු.රෙ. 394(ඇ) | අධිකාරිය විසින් රු.552,652 ක අගයක් සහිත අවලංගු කල චෙක්පත් රජයේ ආදායමට ගැනීමට ක්‍රියා කර නොතිබුණි. |
| | මු.රෙ. 225 (1) හා 232 (2) | අධිකාරියේ වවුචර්, ගෙවීම් සඳහා ඉදිරිපත් කිරීමේදී එම වවුචර් අංක ගත කිරීම,වියදම් සහතික කිරීම, පරීක්ෂා කිරීම හා ගෙවන ලද මුදල ඉලක්කමෙන් හා අකුරෙන් ලිවීම කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 2 පරිච්ඡේදයේ 10(1) වගන්තිය | පත්වීම් ලද දින සිට මාසයක් තුළවත් වෛද්‍ය පරීක්ෂණ වාර්තාව අනිවාර්යෙන්ම ඉදිරිපත් කල යුතු වුවත් , නියැදි පරීක්ෂාවට අනුව ලිපිගොනු 25 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | 06 පරිච්ඡේදය | පෞද්ගලික ලිපි ගොනුවල චර්යා සටහන අමුණා තිබුණද, නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) | 2008 ජූලි 28 දිනැති අංක පීඊඩී/50 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | අධිකාරියේ නිල වාහන හිමි නිලධාරීන් දෙදෙනෙකු විසින් 2010 ජනවාරි සිට මැයි දක්වා මාසික ඉන්ධන වියදම් දීමනාවට අමතරව රු.115,600 ක අතිරේක ඉන්ධන භාවිතා කර තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

---------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.47,757,735 ක ඌනතාවයක් වු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.27,561,973 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,195,762 ක ඌනතාවයේ වර්ධනයක් පෙන්නුම් කෙරුණි.ඌනතාවයේ වර්ධනය ප්‍රතිශතයක් ලෙස 136% කි.

(අ) අධිකාරියේ මුළු ආදායම 2009 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.35,525,664 කින් පිරිහී තිබූ අතර, එය ප්‍රතිශතයක් ලෙස 15% ක. රාජ්‍ය ප්‍රදාන අඩුවීමත් ඉස්සන් වගාව හා විසිතුරු මසුන් නොමිලේ නිකුත් කිරීම නිසා ලැබීම් අඩුවීමත් මීට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) අධිකාරියේ වියදම් අතුරින් පහත සඳහන් වියදම් 2009 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පහත පරිදි වැඩි වී තිබුණි.

| අයිතමය | 2009 | 2010 | වෙනස ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. | රු. | % |
| අතිකාල | 6,503,377 | 14,224,038 | 119 |
| සන්නිවේදන | 1,934,243 | 2,041,667 | 6 |
| පිරිසිදු කිරීම් | 1,020,052 | 1,982,640 | 94 |
| ප්‍රචාරණ | 232,287 | 920,053 | 296 |

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 2.2.1 කාර්ය සාධනය

---------------

2009 හා 2010 වර්ෂවල මිරිදිය හා කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනය පහත පරිදි වේ.

| වර්ෂය | කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනය | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය |
|---|---|---|
| | මෙ.ටොන්. | මෙ.ටොන්. |
| 2009 | 293,170 | 46,560 |
| 2010 | 330,240 | 51,390 |

2009 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනයේ වර්ධනය 13% වන අතර මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයේ වර්ධනය 10% කි.

### 2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1999 ජුනි මාසයේ අධිකාරියේ සේවයට වාර්තා කර ඇති නිලධාරියෙකුට විදේශ රැකියාවක් සඳහා 2007 මාර්තු 15 සිට 2010 මාර්තු 14 දක්වා වසර 3 ක කාලයකට වැටුප් රහිත විදේශ නිවාඩු ලබා දී තිබුණි. අධිකාරිය හා නිලධාරියා වසර 4 ක අනිවාර්ය සේවා කාලයකට හා රු.226,560 ක මුදලක් සඳහා ගිවිසුම් ප්‍රකාරව ඇප අත්සන් කර තිබුණි.වසර 03 ක කාලය 2010 මාර්තු 15 දින අවසන් වී ඇති නමුත්, ඔහු විසින් මෙතෙක් සේවයට වාර්තා කර නොතිබුණු අතර , ඒ සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) ඉස්සන් වගාව වැඩි දියුණු කිරීමට පෞද්ගලික සමාගමක් වෙත ප්‍රතිපූර්ණ පදනම මත ලබාදීම සඳහා අධිකාරිය එම සමාගම සමඟ ගිවිසුමක් ඇති කරගෙන තිබුණි. ගිවිසුම අනුව ඉස්සන් වගාව වැඩි දියුණු කිරීම හා නවීකරණය තුළින් උපයන ලාභයෙන් 80% බැගින් වාරික වශයෙන් අධිකාරියට ප්‍රතිපූර්ණය කිරීමට එකඟ වී පෞද්ගලික සමාගමකට රු.3,161,000 ක මුදලක් ලබාදී තිබුණත් , 2009 හා 2010 වර්ෂවල උපයන ලද ලාභයෙන් අධිකාරියට හිමි කොටස ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රම්බඩගල්ල විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයේ ස්ථාපිත කර ඇති මඩ පොකුණු 07 ක් ඉතා පැරණි වී තිබූ අතර, ඉන් ජලය කාන්දු වීම හා සොරොව් ක්‍රියා විරහිත වීම නිසා පොකුණුවලට ජලය පොම්ප කිරීම හා ඉවත්කිරීම සඳහා විදුලි බලය භාවිතය හේතුවෙන් ආයතනයේ පිරිවැය ඉහළ යමින් පැවතුණි.

(ඈ) රම්බඩගල්ල අභිජනන මධ්‍යස්ථානයට මසුන් අභිජනනය කිරීමේ හා ගබඩා කිරීමේ කාර්යයන්හිදී ප්‍රමාණවත් තරම් ටැංකි නොමැති වීම නිසා මත්ස්‍ය අභිජනන කටයුතු සීමා වී තිබුණි.

(ඉ) 2010 ජූලි 06 දින නිකුත් කර ඇති අභ්‍යන්තර චක්‍රලේඛය මගින් 2010 සැප්තැම්බර් 01 සිට විසිතුරු මසුන් බෙදා හැරීමේ කටයුතු අධිකාරියේ ලියාපදිංචි මසුන් වගාකරුවන්ට පමණක් ඉල්ලීම් කරන ලද අනුපිළිවෙලට නිකුත් කළ යුතු යැයි ප්‍රකාශකර තිබුණද, එවැනි ලියාපදිංචි ලේඛනයක් අධිකාරිය විසින් නඩත්තු කර නොතිබුණි.

(ඊ) මධ්‍යස්ථාන වශයෙන් වෙන් වෙන්ව ආදායම් වියදම් සටහන් නොකිරීම නිසා අධිකාරියේ මධ්‍යස්ථාන 09 ක දරන ලද පිරිවැය මත ළඟා කර ගත් ප්‍රතිලාභවල සාර්ථකභාවය හා ප්‍රගතිය පිළිබඳ තීරණය කළ නොහැකි විය.

(උ) රාජකාරි අවශ්‍යතාවය සඳහන් නොකර, පූර්ව අනුමැතිය රහිතව අංක එන්ඊ - 5455 දරන වාහනය 2010 අප්‍රේල් 12 දින මීගමුව ප්‍රදේශයෙන් තුඩැල්ල කලා වැව පුහුණු මධ්‍යස්ථානය වෙත ධාවනය කර තිබුණි.

(ඌ) ආයතනයේ රියදුරකු නොවන බාහිර පුද්ගලයෙකු විසින් අනුමැතියක් රහිතව දින 11 ක් අධිකාරියේ අංක එන්ඊ-5455 දරණ වාහනය ධාවනය කර තිබීම සහ කාර්යාලයෙන් පිටත ගාල් කර තිබීම.

(එ) රම්බඩගල්ල මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය පුළුල් කිරීම සඳහා පෞද්ගලික ආයතනයකින් ඉඩමක් බදු ගැනීමට යෝජිතව තිබුණද එය බදු නොගෙන වසර 02 කට අධික කාලයක් වාර්ෂික කුලී හා තැන්පතු ලෙස රු.172,000 ක් ගෙවා තිබුණ අතර, එම බදු ගිවිසුම සමාලෝචිත වර්ෂය තුළදීද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඒ) පුහුණු වූවන් සඳහා නිකුත් කළ යුතු සහතික පත්‍ර නිකුත් නොකර අනාරක්ෂිතව ගබඩා කර තිබූ අතර, මුද්‍රණ දෝෂ සහිත සහතිකපත් විනාශ කිරීමකින් තොරව ගබඩා කර තිබුණි.

### 2.2.3 හඳුනාගත් පාඩු

------------------

අධිකාරියේ ප්‍රධාන කාර්යාලය පැලවත්තට ගෙන ඒමේදී එම ගොඩනැගිල්ලේ අධිකාරියට අයත් රු. 641,175 ක් වටිනා සවි කිරීම් විකිණීම සඳහා ටෙන්ඩර් දැන්වීම පළ කිරීමට රු.38,270 ක් වැය කර ඇති නමුත් ඊට අදාල ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවූ අතර එම සවි කිරීම් පැලවත්තේ ස්ථාපිත කරන ලද නව ගොඩනැගිල්ලටද ගෙනවිත් නොතිබුණි. එම වත්කම් අස්ථානගත වී තිබුණ අතර ඒ පිළිබඳ මු.රෙ. 104 ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.2.4 නිෂ්කාර්ය සම්පත්

--------------------

අංක 101 - 6648 දරන යතුරු පැදිය භාවිතයට නොගෙන ගබඩාවේ ගාල් කර තිබුණි.

## 3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අවධානය සඳහා යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකල යුතුවේ.

(අ) තැන්පතු
(ආ) ණයගැතියෝ
(ඇ) මත්ස්‍ය නිෂ්පාදන
(ඈ) ආදායම්
(ඉ) වාහන
(ඊ) වත්කම්
(උ) බදුදීම